වත්‍ර ලේඛ අංක.-94/01

මගේ අංකය: 5/2 ස්වර්ණභූමි 93/94.
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක.07, ග්‍රෙගරි මාවත,
කොළඹ-07.
1994.01.31

ප්‍රාදේශීය ලේකම්,

.....

## ස්වර්ණභූමි කඩිගමී වැඩ සටහන - 1994.

ගරු ඉඩම් විෂය භාර අමාත්‍යතුමාගේ නියෝගය අනුව 1994 වර්ෂය තුළ ස්වර්ණභූමි දීමනාපත්‍ර එක්ලක්ෂ විසිදාහක් යටතේ කර බෙදාදීම සඳහා කඩිනම් වැඩ සටහනක් ඉඩම් අමාත්‍යාංශය සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ අනුව අඩු වශයෙන් මසකට එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් දීමනා පත්‍ර 100 ක් වත් පිළියෙල කිරීම සඳහා ඉලක්ක කර ගත යුතුය.

මේ සම්බන්ධයෙන් ගරු ඉඩම් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට සංවිධානය කර ඇති අතර, එම සාකච්ඡාවලදී දැනට ප්‍රගතිය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා මේ සමඟ එවන ආකෘතියට අනුව වාර්තාවක් සතියක් තුළ මා වෙත එවන ලෙස ද, සෑම මාසයකම මෙම වාර්තාව පළාත් ඉඩම් කොමසාරිස්ට ද පිටපතක් සහිතව මා වෙත එවන ලෙසද කරුණාවෙන් දන්වමි.

මේ සම්බන්ධයෙන් එවන ලද මගේ යමාංක හා 91/3 චක්‍රලේඛයට ඔබගේ කාරුණික අවධානය යොමු කරන අතර, එම චක්‍රලේඛය අනුව මා වෙත එවිය යුතු 7, 8 ආකෘතියේ නියමිත පරිදි වාර්තා නොවීම නිසා ස්වර්ණභූමි අත්තිකාරම් ගිණුම් මුදල් ඉල්ලා කරන ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි වී ඇති බව ද සඳහන් කර අතර, ඔබගේ පුද්ගලික අවධානය යොමු කර මෙම වාර්තා එවීමට කටයුතු කරන්නේ කාවි අගය කරමි.

ඒ. ටී. ප්‍රතිරාජ,
ඉඩම් කොමසාරිස්.

පිටපත :- පළාත් ඉඩම් කොමසාරිස් .....පළාත -අවශ්‍ය කටයුතු සඳහා.

නත්/31.
J 4000

(1) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දැනට බෙදාදී ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව

(2) මෙයින් පේඛා චිත්‍ර ලැබී ඇති කට්ටි සංඛ්‍යාව

(3) දැනට නිකුත් කර ඇති දීමනා පත්‍ර සංඛ්‍යාව

(4) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව

(5) ලියා පදිංචි කර දැනට බෙදාදීමට සූදානම් කර ඇති සංඛ්‍යාව.

(6) නිකුත් කිරීමට ඉතිරි දීමනා පත්‍ර.

(7) 1994 වර්ෂයේ ඉලක්කය.

(8) මෑසය අවසානයට පිළියෙල කිරීමට බලාපොරොත්තු වන ප්‍රදාන පත්‍ර සංඛ්‍යාව

(9) මෑසය තුල ප්‍රදාන පත්‍ර ලාභීන්ට නිකුත් කළ දීමනා පත්‍ර සංඛ්‍යාව.

අල්/31.
J400(1)